
දිනපතා ශු. ජපමාලය
උච්චාරණය කරන්න.



අප මරිය මාතාවෝ ශුද්ධවූ දොමිනික් තුමාට මෙසේ පැවසූ සේක.

දිනෙකදී ජපමාලය සහ කාර්මෙල් බෙන්තිඤ්ඤය මගින් මම ලෝකය ගළවා ගන්නෙමි.

එතුමිය පාතිමා දර්ශනයේදී ලුසී, ජසින්තා, ප්‍රැන්සිස්කෝ යන දරුවන්ට මෙසේ පැවසුවාය.

**"අන්තිමේදී මාගේ නිර්මල හෘදය ජය ගන්නේය. ලොවට එක්තරා සමාදාන කාලයක් දෙනු ලබන්නේ ය."**

## දේව මාතාවන් ශුද්ධවූ ජපමාලය උච්චාරණය කරන අය සඳහා ශුද්ධවූ දොමිනික්තුමා මඟින් දී ඇති පොරොන්දු

01. ජපමාලය විශ්වාසවන්තව යදින අය, අනේක වරප්‍රසාදයන්ට හේතුවන්ත වන්නාහ.

02. ජපමාලය නිති පතා යදින්නන්ට, මම විශේෂ රැකවරණය හා වරප්‍රසාද පොරොන්දු වෙමි.

03. සාතන්ට විරුද්ධව කෙරෙන සටනේදි ජපමාලය කිතුණු ආයුධයක් වන්නේය. එමගින් ගුණධර්ම හා යහපත් ක්‍රියා වඩන්නේය. දෙවිඳුන්ගේ අසීමිත කරුණාවට පංගුකරුවන් වන්නාහ.

05. ලෞකිකත්වය මනුෂ්‍ය හදවත්වලින් දුරුකර සදා දේව ජීවිතයට ඇළුම් කරවන්නෝය.

06. ජපමාලයට විශ්වාසවන්ත වන්නා හදිසි මරණයකට පත් වුවත්, විනාශ මුඛයට පත්නොවී සදාකාල ගැළවීම ලබා ගන්නේය.

07. ජපමාලයේ භක්තිය ඇතිව ජීවත් වන්නාට සිය මරණයට පෙර දේව ප්‍රසාද නිධාන ලැබ ගන්නට අවස්ථාව ලැබෙන්නේ ය.

08. ජපමාලයට විශ්වාසීව දිවි ගෙවන්නා ජීවිතයේදීත් මරණයේදීත් වරප්‍රසාද පිරී, ජීවනාලෝකය ලැබ මරණෙන් පසු සුරදූතයන් සමඟ ස්වර්ගික දිවියට පංගුකාර කරන්නෙමි.

09. ජපමාලයට විශ්වාසවන්ත වන අය ශුද්ධිකාග්නි ස්ථානයෙන් මම මුදවා ගන්නෙමි.

10. විශ්වාසව ජපමාලය යදින්නා ස්වර්ගයේ උසස් තැනකට හිමිකම් ලබන්නෙක් වේ.

11. ජපමාලය අයැද මගෙන් යමක් ඉල්ලන්නා, ඒ සැමදේ ලබා ගන්නේය.

12. ජපමාලය ව්‍යාප්ත කරන්නා මගෙන් ඉල්ලන සැමදේ ලබා ගන්නේ ය.

13. ජීවිතයේදීත් මරණ මොහොතේදීත් සගපුර සකල සුරදූතයන්ගේ වරය ලබා ඇත.

14. ජපමාලය යදින අය මාගේ දරුවෝය. මා පුත් ජේසු තුමාගේ සහෝදර සහෝදරියෝය.

15. ජපමාල භක්තිය, ස්වර්ග රාජ්‍යයට හිමිකරුවෙකු වීමේ මඟකි.

# පටුන


| | |
|---|---|
| ජපමාලයේ භක්ති අභ්‍යාසය | 05 |
| ස්ප්‍රීතු සාන්තු යැදුම | 06 |
| ශුද්ධවූ ජපමාලයේ යැදුම් | 06 |
| සොම්නස් අභිරහස් | 12 |
| ආලෝකයේ අභිරහස් | 17 |
| දොම්නස් අභිරහස් | 22 |
| මෝක්ෂ අභිරහස් | 27 |
| දේව මාතා ප්‍රාර්ථනාව | 32 |
| නමෝමරිය තුන බැතිය | 36 |
| තුන්කාල ආරාධනා | 39 |
| දේව මාතාවන්ට ප්‍රශංසා ගීය | 41 |
| අති නිර්මල හෘදයට ප්‍රතිකාර ප්‍රාර්ථනාව | 43 |
| මාගේ ගෘහය කැපකිරීම | 46 |
| භාග්‍යවත් ජුසේවාස් පියතුමන් වෙනුවෙන් යැදුම | 47 |
| දේව දයාවේ හෝරාව | 49 |
| ශුද්ධවූ මිඛායෙල් අග්‍රදූතයාණන්ට යාච්ඤාව | 57 |
| ශ්‍රී ගල්ලෙනේ යාච්ඤාව | 58 |

# ජපමාලයේ භක්ති අභ්‍යාසය

ශුද්ධවූ ජපමාලය යනු ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂිත සිද්ධීන් (උපත, ප්‍රසිද්ධ ජීවිතය, දුක් විඳීම, මරණය හා උත්ථානය) සිහිපත් කරමින් උච්චාරණය කරන්නාවූ භාවනාත්මක යැදුමකි. ශුද්ධවූ ත්‍රිත්වයට මහිම ප්‍රශංසාව පුද කරමින් ද, අප විශ්වාසයේ සත්‍යතාවන් පිළිගනිමින් ද, පුත්‍රයාණන් සමඟින් දෙවි පියාණන් අමතමින් ද, දෙව් මවුන්ගේ මැදිහත් බව පතා කරන බැහැපත් ආයාචනයකි. ධ්‍යාන කිරීම සඳහා අභිරහස් ඇතුළත්ව පංති විස්සකින් සමන්විතව ඇති මෙම භක්ති අභ්‍යාසය කුරුසියේ ලකුණින් හා විශ්වාස ලක්ෂණයෙන් ඇරඹෙන අතරම සෑම පංතියකටම පරමණ්ඩල යැදුමක්, නමෝ මරිය දහයක්, ත්‍රිත්ව ස්තෝත්‍රයක් සහ දේව මවුන් ඉගැන්වූ පාතිමා යැදුමද සුවිශේෂීය අභිරහසක්ද අන්තර්ගතය. සෑම පංතියක්ම අවසානයේදී මෙනෙහි කළ යුතු අභිරහස සතියේ දින අනුව යෙදී ඇති අතරම ඒවා කාණ්ඩ හතරකි.

සොම්නස්, දොම්නස්, මෝක්ෂ සහ ආලෝකයේ අභිරහස් යනුවෙනි. ඔප්පු කිරීමේ යැදුම සහ මංගල්‍යාරාධනාවෙන් අභ්‍යාසය නිම වෙයි.

## ස්ප්‍රීතු සාන්තු වහන්සේට යාච්ඤාව

ප්‍ර : ස්ප්‍රීතු සාන්තු දෙවියනි, වැඩමකර ඔබගේ විශ්වාසිකයින්ගේ හෘදයන් පිරෙව්ව මැනව.

උ : ඔබගේ ප්‍රේමයේ ගින්න ඔවුන් තුළ දැල්වුව මැනව.

ප්‍ර : ඔබගේ ස්ප්‍රීතුව යැව්ව මැනව. එවිට ඔවුහු මවනු ලබන්නෝය.

උ : තවද ඔබ පෘථිවියේ විශාලකම අලුත්කර වදාරණ සේක.

### යාච්ඤා කරම්හ

ස්ප්‍රීතු සාන්තු ආලෝකයෙන් විශ්වාසිකයින්ගේ හෘදවල් පැහැදෙව්වාවූ දෙවියනි, එම ස්ප්‍රීතුවෙන් සියල්ල ගැන හරි තේරුම් ගැනීම ලබන්නටත් එහි ශුද්ධවූ සැනසිල්ලෙන් ප්‍රීති සන්තෝෂ වෙන්ටත් අපට සලස්වා වදාළ මැනව. මේ කී දේ අපගේ ස්වාමිවූ ජේසු ක්‍රිස්තුතුමන් උදෙසාම ලැබේවා - ආමෙන් ජේසු.

## ජපමාලයේ යැදුම්

සාන්ත කුරුසේ අඩයාලමෙන් අපේ සතුරන්ගෙන් අප ගලවා දේවා අපගේ දෙවි ස්වාමිනී, පිතාගෙත් පුත්‍රයාගෙත් ස්ප්‍රීතු සාන්තුගෙත් නාමයෙන් ..... ආමෙන්

සුරණ පරාපර දේවාතිදේවා කරුණා දිවැස්ලා ඔබට ප්‍රසන්නව අපට සරණ පිහිට විගස ලැබුණ මැනව. පිතා පුත්‍රයා ස්ප්‍රීතු සාන්තු නම් ත්‍රිත්වයික දෙවි මහෝත්මයාණන්ට ස්තෝත්‍ර වේවා.

ආදිවූවාක් මෙන් .......

## දයාධික මනස්ථාපනය

මාගේ දෙවියනී, මම ඔබට අනදර කළ නිසා බොහෝ සේ වික්ෂෝප වෙමි. මාගේ සියලු පාප වලින් මා සදකල් නිරා ගින්නට හිමි වූ හෙයින්ද, මාගේ දයාබර ජේසුස් ක්‍රිස්තුස් ස්වාමිදරුවන් කුරුසියේ ඇණ ගැසූ හෙයින්ද විශේෂ කොට සර්ව දයා යහපත් කම් ඇත්තාවූ ඔබ වහන්සේට අනදර කළ හෙයින්ද සියලු දේට වඩා ඒවාට වෛර කරමි. මා කළ සියලු පව්වලට මාගේ මුළු හෘදයෙන්ම ක්ෂමාව ඉල්ලමි. ඔබ වහන්සේගේ පිහිටෙන් මින් මතු පව් නොකර සිටින්නටත් පව් ප්‍රස්තා වලින් වැළකී සිටින්ටත් ඒකාන්තයෙන්ම පොරොන්දු වෙමි ආමෙන්

## විශ්වාස ලක්‍ෂණය

අහස පොළාව මැවූ සර්වබලධාරී පිතාවන දෙවියන් කෙරෙහි ද ඔහුගේ ඒක පුත්‍ර වූ අපගේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුස් කෙරෙහිද විශ්වාස කරමි. මොහු ස්ප්‍රීතු සාන්තු විසින් ගැබ වැස කන්‍යා මරිය තුමියගෙන් උපන්නාහ පොන්තියුස් පිලාත්

හට යටහත්ව වද විඳ කුරුසියේ ඇණ ගැසුම්කා උකුත් වී තැන්පත් කරන ලද්දාහ. පාතාලවලට බැස තුන් වැනිදා මළවුන් කෙරෙන් උත්ථාන කර වදාරා පරමණ්ඩලවලට නැගී, සර්ව වල්ලභ වූ දෙවි පියාණන්ගේ දකුණු පාර්ශවයේ හි වැඩ සිටින්නාහ. එහි සිට ජීවතුන්ටත් මළවුන්ටත් නඩු වදාරන්නට වඩිත්මය. ස්ප්‍රිතු සාන්තු කෙරෙහි ද සාධාරණ සාන්ත සභාවෙහි ද, සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභයෙහි ද, පාප ක්ෂමාවෙහිද, මාංශ උත්ථානයෙහිද අනන්ත ජීවිතයෙ ද විශ්වාස කරමි. ආමෙන් ජේසු. (එක් වරක්)

## පරමණ්ඩල ආරාධනාව

ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනි, ඔබවහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා! ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා, ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහි ද ඉටු වේවා! අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව. අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව. පාප අවස්ථාවන්ට අසු වීමට අපට ඉඩ නොදී අයහපතින් අප මුදා ගත මැනව. ආමෙන්. (එක් වරක්)

1. පිතාවන දෙවියන්ගේ කුමාරිකාව වූ පිරිසිදු දේව මාතාවෙනී, අප දේව විශ්වාසයෙහි වැඩි දියුණු වන ලෙස ඔබගේ ශ්‍රී කුමාරයා ඉදිරියේ යාච්ඤා කළ මැනව. **නමෝ මරිය**

2. පුත්‍රවන දෙවියන්ගේ මාතාව වූ පිරිසිදු මරියනී. අප දේව ඇදහීමෙහි දියුණුවන ලෙස ඔබවහන්සේගේ ශ්‍රී කුමාරයා ඉදිරියේ යාච්ඤා කළ මැනව. **නමෝ මරිය**

3. ස්ප්‍රීතු සාන්තු වන දෙවියන්ගේ ප්‍රිය කාන්තාව වූ දේව මාතාවෙනී අප දේව ප්‍රේමයෙහි දියුණුවන ලෙස ඔබවහන්සේ ගේ ශ්‍රී කුමාරයා ඉදිරියේ යාච්ඤා කළ මැනව.

**නමෝ මරිය**

## දේව දූත මංගලම්

නමෝ මරියනී, ප්‍රිය ප්‍රසාද පූර්ණවන්තියනි, ස්වාමින් වහන්සේ ඔබ කෙරෙහිය. ස්ත්‍රීන් අතුරෙන් ආශිර්වාද ලද්දී ඔබ වහන්සේය. ඔබගේ ශ්‍රී කුසෙහි ඵලවන් ජේසුස් ආශිර්වාද ලද්දාහුමය. සාන්ත මරියනී, දේව මෑණියනි, පාපිවූ අප උදෙසා දැනුත් අප මරණ වේලෙහිත් යාච්ඤා කළ මැනව. ආමෙන්. (දස වරක්)

## ත්‍රිත්ව ස්තෝත්‍රය

පිතා පුත්‍රයා ස්ප්‍රීතු සාන්තු නම් ත්‍රිත්ව ඒක දේවියෝත්තමයාණන්ට ස්තෝත්‍ර වේවා. ආදි වූවාක් මෙන් දැනුත් නිති පතාත් අනන්ත කාලයක් වේවා. ආමෙන්.

## පාතිමා යැදුම

අහෝ මාගේ ජේසුනී, අපගේ පාප වලට සමාව දුන මැනව. නිරා ගින්නෙන් අප ගළවා ගත මැනව. සියලු ආත්මයන් ද විශේෂකොට ඔබගේ දයාව ඉතා උවමනා ආත්මයන් ද ස්වර්ග රාජ්‍යයට ගෙන්වා ගත මැනව. ආමෙන් (එක් වරක්)

## ජපමාලය ඔප්පු කිරීම

සකල සුගුණ සම්පන්න වූ කරුණාභරිත වූ දේව මාතාවෙනි, ඔබ වහන්සේගේ ශ්‍රී පාද පද්මයට වැඳ නමස්කාර කර මේ ජපමාල ධ්‍යානය ඔබ වහන්සේට කියා ඔප්පු කර සිටිමු. මෙහි දී අප විභාග කළ කාරණාවල් අපට සිද්ධ කොට දී මෙලොවින් අප මිදී ගිය කල්හි ඔබ හා ඔබගේ ශ්‍රී කුමාරයාණන් දැක මෝක්ෂ සම්පත් ලබන සැටියට කරුණා කර වදාළ මැනව. ආමෙන්.

## මංගල්‍ය ආරාධනාව

මංගල්‍යස්තු රාජේශ්වරිනී, කෘපදයා මාතාවෙනි, අපේ ජීවිතයෙනි, අපේ අමෘතයෙනි, අපේ ආධාරෙනි, මංගල්‍යස්තු ! පරදේශවාසී වූ අපි ඒව අම්මාගේ පුත්‍රයෝ ඔබටම අඬගසම්හ. මේ කඳුළු විලෙහි අඬා වැලපී ඔබට ම සුසුම්ලම්හ. එසේ හෙයින් අපගේ මධ්‍යස්තිනී, මේ ඔබගේ දයාබර නේත්‍රවල් අප දෙස යොමු කළ මැනව. තවද

මේ පරදේශය පසු වූ ඉක්බිති ඔබගේ ශ්‍රීකුසෙහි ආශිර්වාදලත් ඵලවන් ජේසු තුමන්ගේ දර්ශනය අපට ලබා දුන මැනව.

දයාවන්තියනි, පරදුඃඛ්‍යා දුඃඛිතිනි, මධුර වූ නිත්‍ය කන්‍යා මරියනි, සාන්ත වූ දේව මෑණියනි, ක්‍රිස්තු වාක්දාතවලට අප හේතුවන්තයන් වන ලෙස කන්‍යා ශුද්ධවු දේව මාතාවෙනි, අප උදෙසා යාච්ඤා කළ මැනව. ආමෙන්.

## අපි යාච්ඤා කරමු

සර්වෝත්තම වූ දෙවි පියාණෙනී, ඔබ වහන්සේගේ ශ්‍රී කුමාරයාණෝ තමන් වහන්සේගේ ජීවිතය හා මරණය ද මළවුන්ගෙන් උත්ථාන වීම ද කරණකොටගෙන සදාතන ජීවිතයේ විපාකය අපට දානය කරන සේක් වේද? භාග්‍යවත් කන්‍ය මරිය තුමියගේ ජපමාලයේ අභිරහස් භාවනා කිරීමෙන් ද එහි අන්තර්ගත ධර්ම ගුණ අනුසාර කිරීමෙන් ද පොරොන්දු වූ එම විපාකය අත්කර ගන්නට අපට වරම් දෙවා වදාළ මැනව. ආමෙන්.

# සොම්නස් අභිරහස්

(සඳුදා, සෙනසුරාදා සහ ආගමන සමයේ ඉරුදිනවල)

## පළමුවන සොම්නස් අභිරහස



## 1. කුමරි මරියාවන්ට මංගලම් කීම.

## රහස - දේවභක්තිය දියුණු වීම සඳහා

### යාච්ඤා කරම්හ.

ආනන්දබර මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබ තුමියගේ ශ්‍රී කුසයෙහි දේව පුත්‍රයා පිළිසිඳුණු කල, සොම්නස් කම්පා වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතු කොට ගෙන අපේ සිත්වල දේව භක්තිය උපදින්නට, වරම් ලබාදෙනවා සෝදේ.

ශුද්ධවූ ලූක් 1:30-31

## දෙවන සොම්නස් අභිරහස



## 2. කුමරි මරියාවෝ එළිසබෙත් තුමිය බැහැදැකීමට යාම

## රහස - පරහට දයාව දියුණු වීම සඳහා

### යාච්ඤා කරම්හ.

ආනන්දබර මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබ තුමියගේ බන්ධුවන් වූ එළිසබෙත් තුමිය ගර්භණී වූ බව බලන්ට ගොස් මංගලම් අසා සොම්නස් කම්පා වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපත් ඔවුනොවුන්ට සහෝදරයන් සේ දයාකොට පවතින්ට වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ ලූක් 1:42-43

## තෙවන සොමිනස් අභිරහස



# 3. දෙව් බිළිඳාණන්ගේ උත්පත්තිය
# රහස - සිත්හි දිළිඳුබව

### යාච්ඤා කරම්හ.

ආනන්දබර මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි ඔබ තුමියගේ ශ්‍රී කුසයෙන් දිළිඳුකමින් බිහිවූ දේව කුමාරයා දුක සොමිනස් කම්පා වූ විභාගයට මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපටත් දිළිඳුභාවයෙන් සතුටුව දවස් අරින්ට වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ ලූක් 2:7

# සිව්වන සොම්නස් අභිරහස



## 4. දෙව් බිළිඳාණන් දේව මාලිගයේ පුදකිරීම රහස - අප ආත්ම දේව දර්ශනයට ඔප්පු කරමු.

**යාච්ඤා කරම්හ.**

ආනන්දබර මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමියගේ ශ්‍රී කුමාරයා උපන් සතළිස් වෙනි දිනේදී දේවස්ථානයේ දක්වන්නට වඩවාගෙන ගියතැන, උන්වහන්සේගේ දේව මහිමය ප්‍රසිද්ධ වූ බව දැක සොම්නස් කම්පා වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොට ගෙන අපේ ආත්මවල් දේව දර්ශනයට ඔප්පු වෙන සැටියට වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ ලූක් 2: 34-35

## පස්වන සොම්නස් අභිරහස



## 5. දෙව් කුමරා දේව මාළිගයේ නැතිව සිට සම්භ වීම.

**රහස - අප පාපයෙන් දේව දර්ශනය මුලාසි නොවෙන්ට යාච්ඤා කරම්හ.**

ආනන්දබර මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමියගේ ශ්‍රී කුමාරයා දොළොස් වයසේ දී තුන් දවසක් කොයිදෝ වූ කල සොයා දැක සොම්නස් කම්පා වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපේ පාපවලින් අපට දේව දර්ශනය මුලාසි නොවන සැටියට වරම් ලබාදෙනවාසෝදේ.

ශුද්ධවූ ලූක් 2:41-52

# ආලෝකයේ අභිරහස්

(බ්‍රහස්පතින්දා දිනවල)

# පළමුවන ආලෝකයේ අභිරහස



## 1. ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබීම රහස - දේව පුත්‍රභාවයට පිපාසයක්

**යාච්ඤා කරමුහ.**

ප්‍රිය ප්‍රසාදවලින් පූර්ණ වූ කන්‍යා බිසෝවෙනි "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය, ඔබ කෙරේ ඉතා ප්‍රසන්නවී සිටිමි." යන දෙව් පියාණන් වහන්සේගේ හඬ අපටත් ඇසෙන්නට අවැසි වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ ලූක් 3;22



## 2. කානා නුවර විවාහ මංගලෝත්සවය රහස - මරිය තුමියගේ මැදිහත්වීම අත්දැකීමට

**යාච්ඤා කරම්හ.**

ප්‍රිය ප්‍රසාදවලින් පූර්ණ වූ කන්‍යා බිසෝවෙනි! ජේසුස් වහන්සේ සැබෑ දෙවියන් බව පිළිග න්නටත්, ඔබතුමියගේ මධ්‍යස්ථභාවය තුළින් ජේසු සමිඳාණන් අප වෙත දක්වන කරුණාව වටහා ගන්නටත් අවැසි වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ ජුවාම් 2:3-5

## තෙවන ආලෝකයේ අභිරහස



# 3. ජේසුස් වහන්සේ කඳු මුදුනේ දී දේව රාජ්‍ය ප්‍රකාශ කිරීම

## රහස - දේව රාජ්‍යය පතළ කිරීමට ආශාවක්

### යාච්ඤා කරම්හ.

ප්‍රිය ප්‍රසාදවලින් පූර්ණ වූ කන්‍යා බිසෝවෙනි ජේසු සමිඳුන් උගන්වා වදාළ දේව රාජ්‍යයේ උතුම් වටිනාකම් අනුව ලෝ තුළ දිවි ගෙවමින් අවසානයේදී දේව රාජ්‍යයේ උරුම කරුවන් වන්නට අපට අවැසි වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ මතෙව් 5:1-12



## 4. ජේසුස් වහන්සේගේ අන්‍ය රූප විලාශවීම රහස - ගැඹුරු යාච්ඤා ජීවිතයකට පිපාසයක්

**යාච්ඤා කරම්හ.**

ප්‍රිය ප්‍රසාදවලින් පූර්ණ වූ කන්‍යා බිසෝවෙනි! අප අතර ජීවමානව වැඩ සිටින ජේසුස් ස්වාමින් වහන්සේගේ ශුද්ධවූ වචනයට සවන් දෙමින්, එය අයිති කරගෙන අපගේ ජීවිතාන්තයේදී මහිමයට පත් වනු සඳහා අවැසි වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ මාක් 9:2-8

## පස්වන ආලෝකයේ අභිරහස



## 5. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම රහස - ජීවමාන ජේසු මුණගැසීමට පිපාසයක්

**යාච්ඤා කරම්හ.**

ප්‍රිය ප්‍රසාදවලින් පූර්ණ වූ කන්‍යා බිසෝවෙනි! ජීවමාන ජේසු සමිඳාණන්ගේ ශ්‍රී ශරීරයට හා රුධිරයට පංගුකාරවීමෙන් ලබන ශක්තිය හා පෝෂණය තුළ එකමුතු සහෝදරත්වයෙන් යුතුව අන් අය වෙනුවෙන් කැඩෙන්නට බිඳෙන්නට තරම් උතුම් වූ ප්‍රේමයේ ජීවිතයක් ගෙවනු සඳහා අවැසි වරම් අපට ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ මතෙව් 26:26-29

# දොම්නස් අභිරහස්

(අඟහරුවාදා, සිකුරාදා සහ චතාරික සමයේ ඉරුදිනවල)

## පළමුවන දොම්නස් අභිරහස



## 1. ජේසුස් වහන්සේ මල් උයනේ දුක්විඳීම රහස - අපේ යාච්ඤා දෙවියන්ට ඔප්පු වෙන පිණිස

**යාච්ඤා කරම්හ.**

වික්ෂෝප මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමියගේ ශ්‍රී කුමාරයා මල් උයනේදී මරණාසන්න දුකින්, පිතාවන දෙවියන්ට යාච්ඤා කළ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොට, අපිත් අපේ අපහසුවෙලෙහි කරන යාච්ඤාවල්, දෙවියන්ට ඔප්පුවෙන සැටියට වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ මාක් 14:34-36

# දෙවන දොම්නස් අභිරහස




## 2. ජේසුස් වහන්සේ ගල් කණුවේ කස පහර විඳීම රහස - අප පව්වලට ලැබෙන අච්චු ඉවසීමට

**යාච්ඤා කරම්හ.**

වික්ෂෝප මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමියගේ ශ්‍රී කුමාරයා ගල්කනුවේ බැඳුම්කා කසපහරවල් විඳි විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපේ, පව්වලින් අපට යෙදෙන අච්චු, ශුභ සිතින් ඉවසන්නට වරම් ලබා දෙනවා සොඳේ.

ශුද්ධවූ ජුවාම් 19:1

# තෙවන දොම්නස් අභිරහස



## 3. ජේසුස් වහන්සේගේ හිස මත කටු ඔටුන්නක් පළඳවනු ලැබීම

## රහස - මෙලොව මාන්නයට ආශා නොවෙන්නට

යාච්ඤා කරම්හ.

වික්ෂෝප මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමියගේ ශ්‍රී කුමාරයා කටු ඔටුන්නක් දරා නින්දා පරුෂවල් ඉවසූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපටත් ලෝකමාන්න තාන්නවලට ආශා නොවන සැටියට, වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ මාක් 15:17-18

# සිව්වන දොම්නස් අභිරහස



## 4. ජේසුස් වහන්සේ කුරුසිය උසුලාගෙන යාම රහස - පව් බරින් අපට යෙදෙන කොයි දුකත් උසුලන්නට

### යාච්ඤා කරම්හ.

වික්ෂෝප මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමියගේ ශ්‍රී කුමාරයා බර වූ කුරුසේ උසුලාගෙන කපාල කන්දට වඩින්නා දැක දුක් වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොට ගෙන, අපේ පව්බරින් අපට යෙදෙන කොයියම් දුකක් උසුලන්නට, වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ ජුවාම් 19:17




## 5. ජේසුස් වහන්සේ කුරුසියෙහි උකුත් වීම රහස - මෙලොව සැපතට ආශා නොවීමට

### යාච්ඤා කරම්හ.

වික්ෂෝප මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමියගේ ශ්‍රී කුමාරයා කුරුසේ වදවිඳ උකුත්වුණා දක දුක් වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපටත් ලෝක සැපතට මළවුන්සේ කල්යවනා ලෙස, වරම් ලබා දෙනවා සොඳේ.

ශුද්ධවූ ලූක් 23:46

# මෝක්ෂ අභිරහස්
(ඉරුදින සහ බදාදා දිනවල)

## පළමුවන මෝක්ෂ අභිරහස



## 1. ජේසුස් වහන්සේගේ උත්ථාන වීම රහස - පාපයෙන් මිදී සිටින්නට

**යාච්ඤා කරම්හ.**

මෝක්ෂ සම්පන්න මාතාවූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබ තුමියගේ ශ්‍රී කුමාරයා මළවුන් කෙරෙන් උත්ථාන කර වදාළා දැක සන්තෝෂ වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතු කොටගෙන, අපටත් පාප නමැති මරණයෙන් නැඟී සිටින්නට වරම් ලබාදෙනවා සොඳේ.

ශුද්ධවූ මතෙව් 28:5-6

# දෙවන මෝක්ෂ අභිරහස



## 2. ස්වාමින්වහන්සේ ස්වර්ගාරෝහණ වීම රහස - පරලෝක මාර්ගය අත් නොහැරීමට

යාච්ඤා කරම්හ.

මෝක්ෂ සම්පන්න මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබ තුමියගේ ශ්‍රී කුමාරයා පරලොවට වඩින්නා දැක සන්තෝෂ වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපටත් පරලෝක මාර්ගය අත්නොහැර පවතින්ට වරම් ලබාදෙනවා සොඳේ.

ක්‍රියා 1:9-11



## 3. ශුද්ධාත්මයාණන් වැඩම කිරීම රහස - ස්ප්‍රීතුසාන්තු ප්‍රසාද ලබාගැනීමට

### යාච්ඤා කරම්හ.

මොක්ෂ සම්පන්න මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමිය වෙතෙහි හා ගෝලයන් වෙතත් ස්ප්‍රීතු සාන්තු වැඩිය කල සන්තෝෂ වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොට ගෙන, අපටත් ස්ප්‍රීතුසාන්තු ප්‍රසාදවල් ලබා දෙනවා සොඳේ.

ක්‍රියා 2:2-4



## 4. දෙව් මවුන් ස්වර්ගාරෝපණය වීම
## රහස - පරලොව බලාපොරොත්තු වීම

**යාච්ඤා කරම්හ.**

මෝක්ෂ සම්පන්න මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමිය ආත්ම ශරීර පිටින් පරලොවට වඩින කල සන්තෝෂ වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපටත් නඩු තීන්දු දිනේදී මෝක්ෂ ප්‍රභා ශරීර පිටින් පරලොවට යන්ට වරම් ලබා දෙනවාසොඳේ.

ජුදිත් 13:18

## පස්වන මෝක්ෂ අභිරහස



### 5. දෙව් මවුන් ස්වර්ග රාජ්‍යයෙහි ඔටුණු පැළඳවීම රහස - මෝක්ෂය ලබා ගැනීමට

**යාච්ඤා කරමහ.**

මොක්ෂ සම්පන්න මාතා වූ පිරිසිදු කන්‍යා බිසෝවෙනි! ඔබතුමියට දිව්‍ය රාජ්‍යයේදී මොක් ඔටුණු ලැබුණු කල සන්තෝෂ වූ විභාගයට, මේ දස ආරාධනා පන්තිය හේතුකොටගෙන, අපටත් අන්තිමේදී මොක් ඔටුණු ලබාදෙනවා සොඳේ.

එළිදරව්ව 12:1

# දේව මාතා ප්‍රාර්ථනාව

ස්වාමිනී කරුණා කළ මැනව.
ක්‍රිස්තුනී කරුණා කළ මැනව
ස්වාමිනී කරුණා කළ මැනව
ක්‍රිස්තුනී අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව.
ක්‍රිස්තුනී අපේ ප්‍රාර්ථනා ගිවිස වදාළ මැනව.
පරමණ්ඩලවල වැඩ ඉඳින පිතාවන දෙවියනී.
ලෝකය නිදහස් කළා වූ පුත්‍රවන දෙවියනී,
ස්ප්‍රිතු සාන්තු වන දෙවියනී,
සුපරිශුද්ධ ත්‍රිත්වය වූ ඒක දෙවියනී,
ශුද්ධවූ මරියනී,
ශුද්ධවූ දේව මෑණියනී,
කන්‍යාති කන්‍යාවෙනි,
ක්‍රිස්තෝත්තමයාගේ මාතාවෙනි,
දේව ප්‍රසාද මාතාවෙනි,
අති සුවිශුද්ධ වූ මාතාවෙනි,
අති ව්‍රතවූ මාතාවෙනි,
කන්‍යා ව්‍රත අභින්න වූ මාතාවෙනි,
කන්‍යා ශුද්ධ අනූන වූ මාතාවෙනි,
ප්‍රේමණීය වූ මාතාවෙනි,
ආශ්චර්ය යුක්ත වූ මාතාවෙනි,
යහපත් අනුශාසනාදායක වූ මාතාවෙනි,
ශ්‍රේෂ්ඨ ඇදුරාගේ මාතාවෙනි,
රක්ෂාධිකාරහුගේ මාතාවෙනි,

විශාරද බුධයාග්‍ර වූ කන්‍යාවෙනි,
වන්දනීය වූ කන්‍යාවෙනි,
ප්‍රශංසනීය වූ කන්‍යාවෙනි,
ශක්තිධාරී වූ කන්‍යාවෙනි,
දයාභරිත වූ කන්‍යාවෙනි,
විශ්වාස පක්ෂ වූ කන්‍යාවෙනි,
ධර්මනීති දර්පණෙනි,
පරම ඥාන ආසනෙනි,
අපේ ආනන්ද කාරණාවෙනි,
ඥාන පාත්‍රෙනි,
අග්‍රාචාර යුක්ත වූ පාත්‍රෙනි,
අනර්ඝ වූ භක්ති පාත්‍රෙනි,
දිව්‍ය අභිරහස් විෂයක පද්මයෙනි,
දාවිත් රාජේන්ද්‍ර කීලෙනි,
දන්තමය ගෝපුරෙනි,
ස්වර්ණමය මන්දිරෙනි,
වාක්ප්‍රසාද ගැබයෙනි,
පරමණ්ඩල වාසලෙනි,
උදය තාරකාවෙනි,
රෝගීන්ගේ ආරෝග්‍යයෙනි,
පව්කාරයින්ගේ අඩක්කලමෙනි,
වික්ෂිප්තයින්ගේ සැනසීමෙනි,
ක්‍රිස්තියානින්ගේ පිහිටෙනි,
සූරතාවයින්ගේ රාජේශ්වරියනි,

ආදිපිතුරුවන්ගේ රාජේශ්වරියනි,
දිවැස් ප්‍රසාදීන්ගේ රාජේශ්වරියනී,
වේද සාක්ෂිවරයන්ගේ රාජේශ්වරියනි,
අපෝස්තුළුවරුන්ගේ රාජේශ්වරියනි,
වන්දනාවාදීන්ගේ රාජේශ්වරියනි,
කන්‍යාවන්ගේ රාජේශ්වරියනි,
සමස්ත ශුද්ධවන්තයන්ගේ රාජේශ්වරියනි,
ජන්ම දෝෂරහිතව පිළිසිඳුනාවූ රාජේශ්වරියනි,
ස්වර්ගාරෝපිත වූ රාජේශ්වරියනි,
ශුද්ධවූ ජපමාල රාජේශ්වරියනි,
සමාදානයේ රාජේශ්වරියනි,

ලෝක පාපවල් හරින දේවාජබාලක වූ ජේසුනි
අපට ක්ෂමා කළ මැනව ස්වාමි

ලෝක පාපවල් හරින දේවාජබාලක වූ ජේසුනි
අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව ස්වාමි,

ලෝක පාපවල් හරින දේවාජබාලක වූ ජේසුනි
අපට දයා කළ මැනව ස්වාමි

ක්‍රිස්තු තුමන්ගේ වාක්දානවලට අප හේතුවන්ත වෙන ලෙස,
කන්‍යා ශුද්ධ වූ දේව මාතාවෙනි, අප නිසා යාච්ඤා කළ මැනව.

## යාච්ඤා කරම්හ

සර්වබලධාරීවූ අනාදි අනන්ත වූ දෙවියනි, මෝක්ෂසම්පන්න මාතාවන් වන කන්‍යාමරිය තුමන්ගේ ගත හා ප්‍රාණය ඔබගේ ශ්‍රී කුමාරයාට ඔබින වාසස්ථානය වන ලෙස ස්ප්‍රීතු සාන්තු වරමින් හේතු යුක්ත කරදී වදාළාවේද? අප සතුටුව සිහි කරන ඕතුමියගේ දයාබර යාච්ඤාව බලා අපට යෙදෙන්නාවූ නපුරු වලින් හා අනවර්ථ මරණයෙන් ගැළවීම සැලසුව මැනව. මේ කී දේ අපේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුන් තුමන් උදෙසාම ලැබේවා, - ආමෙන්.

## නමෝ මරිය තුන උච්චාරණය කිරීමෙන් ස්වර්ග රාජ්‍යය විවෘත විය.



## නමෝ මරිය තුනෙහි අප ස්වාමි දුව

ශුද්ධවූ ත්‍රිත්වයේ නිර්මල
ලිලී පුෂ්පයෙනි
අප නිසා යාච්ඤා කළ මැනව.

මරියතුමියගේ නිකැළැල් කන්‍යාභාවයට ගෞරව කිරීමටත්, තම ජීවිත කාලය තුළදී සහ මරණ මොහොතේදී වරප්‍රසාද බහුලව ලබා ගැනීමටත් මෙම භක්ති අභ්‍යාසය උච්චාරණය කිරීමේ වැදගත්කම ශුද්ධවූ අන්තෝනි තුමා, ශුද්ධවූ ලෙනාඩ්තුමා මෙන්ම ශුද්ධවූ අල්පොන්සස් ලිගෝරි තුමා ද අවධාරණය කර ඇත්තේය.

## උදය යාච්ඤා සඳහා

අහෝ මාගේ මෑණියෙනි, මේ දවස පුරාම මා මරණීය පාපයෙන් බේරා ආරක්ෂා කළ මැනව.

## සවස යාච්ඤා සඳහා

අහෝ මාගේ මෑණියෙනි, මුළු රාත්‍රිය තුළ මරණීය පාපයෙන් මා මුදා ආරක්ෂා කළ මැනව.

## ශු. ත්‍රිත්වයේ අප ස්වාමිදුවට කැපවීමේ යාච්ඤාව

ස්වර්ගයේ සියලුම සුරදූතයන්ට හා ශුද්ධ වන්තයින්ට වඩා උතුම් වූ ද, සදාකාලික පිතාවන දෙවියන්ගේ දියණිය වූ ද අති පරිශුද්ධ කන්‍යාවෙනි, මාගේ මුළු හෘදයෙන්ම මම ඔබට ප්‍රශංසා කරමි. මාගේ ආත්මය හා ඊට සම්බන්ධ මහා මහිමය මම ඔබවහන්සේට කැප කරමි.

නමෝ මරියනි ...

ස්වර්ගයේ සියලුම සුරදූතයන්ට හා ශුද්ධ වන්තයින්ට වඩා උතුම් වූද පුත්‍රවන දෙවියන්ගේ සදාදර මෑණියන් වූ ද අති පිරිසිදු කන්‍යාවෙනි, මාගේ මුළු හෘදයෙන් මම ඔබට ප්‍රශංසා කරමි. මාගේ ශරීරය හා ඊට අදාළ - සියලුම ඉන්ද්‍රියයන් ද මම ඔබ වහන්සේට කැප කරමි.

නමෝ මරියනි ...

ස්වර්ගයේ සියලුම සුරදූතයන්ට හා ශුද්ධ වන්තයන්ට වඩා උතුම් වූ ද ශුද්ධාත්මයාණන්ගේ ප්‍රිය කාන්තාව වූ ද අති උත්තම කන්‍යාවෙනී, මාගේ මුළු හෘදයෙන් මම ඔබවහන්සේට ප්‍රශංසා කරමි. මගේ හෘදය ද ඊට අදාළ ආදර ප්‍රේමය ද ඔබට කැප කරමින් අති ශුද්ධවූ ත්‍රිත්වයෙන් ආත්ම ගැළවීම සඳහා මා හට අවැසි සියලුම වරප්‍රසාද ලබාදෙන මෙන් ඔබ වහන්සේගෙන් අයැද සිටිමි.

නමෝ මරියනි ...

දිනකට තුන්වරක් අපි ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගත වීමේ අභිරහස සිහිපත් කරමින් මෙම යැඳුම උච්චාරණය කරමු.

(උදේ 5.30 සිට දහවල් 12.00 හවස 6.30)

## තුන්කාල ආරාධනාව

ස්වාමින්ගේ දූතයා මරියතුමීට සැල කළේය, එවිට ස්ප්‍රිතු සාන්තු විසින් ගර්භනී වූවා ය.
නමෝ මරියනි ...

මේ මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි, නුඹ කී වචනය ලෙස මට සිදුවේවා.
නමෝ මරියනි ...

වචනය තෙමද මාංශගත වුණේය,
අප සමගද වාසය කළේ ය.
නමෝ මරියනි ...

ක්‍රිස්තුතුමන්ගේ වාක්දාතවලට අප හේතුවන්ත වන ලෙස, කන්‍යා ශුද්ධවූ දේව මාතාවෙනී අප නිසා යාච්ඤා කළ මැනව.

### යාච්ඤා කරම්හ

ස්වාමිනි, සුරදූතයා සැලකළ වචනයෙන් ඔබගේ පුත්‍ර වූ ක්‍රිස්තුතුමන්ගේ මනුෂ්‍යයා වීම දැනගත්තාවූ මේ අපි එතුමන්ගේ දුක්ප්‍රාප්තිය හා කුරුසිය උදෙසා මෝක්ෂ ප්‍රතාප මහිමතාවයෙන් මාංශෝත්ථානය ලබන ලෙස අපගේ ආත්මවල් ඔබගේ කරුණා ප්‍රසාදයට හේතු යුක්ත කොටගෙන වදාළ මැනව. මේ කී දේ අපගේ ස්වාමීන් වූ ජේසුස් ක්‍රිස්තුස් තුමන් උදෙසාම අපට ලැබේවා - ආමේන්.

ත්‍රිත්ව ස්තෝත්‍රය තෙවරක් කියන්න.

## පාස්කු කාලයෙහි තුන්කාල ආරාධනාව

(ආලේලූයා සෙනසුරාදා පටන් ශුද්ධාත්ම ආගමන මංගල්‍යයට පසු එන සෙනසුරාදා සවස දක්වා භාවනා කළ යුතුය)

- ★ පරලෝක රාජේශ්වරියනි, ආනන්ද සන්තෝෂ වේවා - ආලේලූයා
- ★ ඒ කිම්දයත් ඔබගේ ශ්‍රී කුසෙහි වාසය කරන්නට අභිප්‍රාය කළ තෙම. - ආලේලූයා
- ★ තමන් වහන්සේ පෙර වදාළ ප්‍රකාරයෙන් නැගී වදාළ සේක - ආලේලූයා
- ★ අප නිසා දෙවියන් වහන්සේට යාච්ඤා කළ මැනව - ආලේලූයා
- ★ කන්‍ය මරිය තුමියනි, ආනන්ද සන්තෝෂ වේවා - ආලේලූයා
- ★ ඒ කිම්දයත් ජේසු ස්වාමිදරුවෝ සැබවින්ම නැගිට වදාළ සේක - ආලේලූයා

### යාච්ඤා කරම්හ

සර්වේශ්වර වූ දෙවියනි, ඔබ ගේ පුත්‍ර වූ ක්‍රිස්තු තුමන්ගේ මාංශොත්ථානයෙන් ලෝකය සන්තෝෂ කරන්නට කරුණා අභිප්‍රාය කර වදාළා වේද? උන් වහන්සේගේ මාතාවන් වන කන්‍යා මරිය තුමිය උදෙසා අපට අනන්තකාල සතුටු සිත් දෙවා වදාළ මැනව. මේ කී දේ අපගේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුස් උදෙසාම ලැබේවා - ආමෙන්

- ★ ත්‍රිත්ව ස්තෝත්‍රය තෙවරක් කියන්න.

## දේව මාතාවන්ට ප්‍රශංසා ගීය

ශුද්ධවූ මරියනී, ස්වර්ග රාජේශ්වරියනි, ප්‍රසාද පූර්ණවන්තියෙනි, අපි ඔබට ප්‍රශංසා කරමු. ගාබ්‍රියෙල් දේව දූතයා ඔබට මංගලම් කී අවස්ථාවේදී ඔබ වහන්සේ පිතාවන දෙවියන් වහන්සේගේ ආදර දියණිය වූවා සේම, ශුද්ධාත්මයාණන්ගේ ප්‍රිය කාන්තාව ද වූ සේක.

එමෙන්ම, ජේසුතුමන්ගේ ආදර මෑණියන් වූ සේක. ඒ නිසා ම ශුද්ධවූ ත්‍රිත්වය තුළ ඔබ විද්‍යාමාන විය. අහෝ! කෙතරම් උතුම් වූ මොහොතක්ද? මීටත් වඩා සතුටක් භාග්‍යයක් තවත් කොයින්ද? ඒ උතුම් වූ නිමේෂය සිහිකොට ඔබ වහන්සේ අත්කර ගත්තා වූ ඒ මහත් භාග්‍යය උදෙසා අපි ඔබට ප්‍රශංසා කරමු.

සුසිත් ජනයාගේ ගැලවීම උදෙසා ගැලවීමේ මාතාවන් වූ මෑණියනී, අපි ඔබවහන්සේට ප්‍රශංසා කරමු. ශුද්ධාත්මයාණන් ගේ ප්‍රිය කාන්තාව වූ මෑණියනී, අපි ඔබවහන්සේට ප්‍රශංසා කරමු. දෙවියන් වහන්සේගේ ආදර දියණිය වූ මෑණියනී, අපි ඔබ වහන්සේට ප්‍රශංසා කරමු.

සකල ලෝ වාසීහු දේව මාතාවන්ට ප්‍රශංසා කරත්වා.

සියලු සුරදූතයෝ දේව මාතාවන්ට ප්‍රශංසා කරත්වා.
ඉර හඳ තාරකාවෝ දේව මාතාවන්ට ප්‍රශංසා කරත්වා.

පොළෝ තලයත් එහි වසන සියල්ලනුත් අප මෑණියන්ට ප්‍රශංසා කරන්න.
හිම හා වැහි වළාවෙනි, උණුසුම් හා සීතල සුළඟෙනී, තැනිතලා සහ කඳු වැටි සියල්ලෙනි, ස්වර්ගීය මාතාවන්ට ප්‍රශංසා කරන්න.

ගංගා උල්පත් ආදියෙනි, අව් වැසි සුළං ආදියෙනි, ස්වර්ගීය මාතාවන්ට ප්‍රශංසා කරන්න.

මහා සාගරය හා එහි වසන සියල්ලෙනි, මෑණියන්ට ප්‍රශංසා කරන්න.

ආදර මෑණියනී, ශුද්ධ වූ ත්‍රිත්වය සමඟ එක්ව අප කරන මේ ප්‍රශංසාව පිළිගෙන අපට ආශිර්වාද ලබා දුන මැනව. කෙදිනක හෝ මෙලොවින් තුරන්ව ඔබ ඉදිරියේ නිදොස්ව පෙනී සිටි ස්වර්ගයේදී ද ඔබට ප්‍රශංසා කරන්නට අපට වරම් දුන මැනව.

මේ කී දේ ඔබ වහන්සේගේ පුත්‍රයාණන් හා අපගේ ස්වාමීන් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ උදෙසාම ලැබේවා. ආමේන්.

# අති නිර්මල හෘදයට ප්‍රතිකාර ප්‍රාර්ථනාව

අති නිර්මල කන්‍යා මාතාවෙනි, පරිශුද්ධ ත්‍රිත්වයේ ඒකානන්දයෙනි, දේවදූත නව පන්තීන් ගේ මුදුන් මල්කඩෙනි, ශුද්ධවර සියල්ලන්ගේ මහිමයෙනි, පව්කාර අපගේ කුළුණුබර මාතාවෙනි, අඥානයන්ද ගුණමකුවන් හා දුෂ්ටයන්ද, ඔබට විරුද්ධව කියන කරන භයානක දුෂ්කෘත හා සාහසික අපරාධයන් එකක් එකක් පාසා ඔබගේ අති පෙම්බර හෘදයට වන්දි ගෙවීමේ ආශාවෙන් අපි ඔබ ඉදිරියේ ශෂ්ඨාංගයෙන් වැඳ වැටී සිටිමු. ශුද්ධවූ ත්‍රිත්වයේ තුන්දෙනා වහන්සේලා ද සුරලොව නරලොව සුසිත් ජනයන් හා මුළු මැවිල්ල ද, ඔබට පෙන්වන ආදර ගෞරවයට එක්කොට, අප ඔබට ඔප්පු කරන මේ ප්‍රතිකාරය දයාවෙන් පිළිගත මැනව.

01. ඔබවහන්සේගේ ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳීම ගැන කරන අපහාසයන් උදෙසා

02. මරිය යන ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට කරන අවමාන්න උදෙසා

මෑණියනි අපි ඔබ වහන්සේට සැනසීම දෙමු

03. ඔබවහන්සේගේ සුපරිශුද්ධ ජීවිතය ගැන කරන අගෞරවයන් උදෙසා,

04. ඔබවහන්සේගේ කන්‍යාවෘත භාවයට කරන නිග්‍රහයන් උදෙසා,

05. ඔබවහන්සේගේ කන්‍යාවෘත පවුල් ජීවිතයට කරන නින්දිතකම් උදෙසා,

06. ඔබවහන්සේගේ කෞමාර මාතෘත්වයට කරන සමච්චල් උදෙසා,

07. ඔබවහන්සේගේ කුළුණුබර දයාවට කරන ගුණමකුකම් උදෙසා,

08. ඔබවහන්සේගේ පරම බලයට කරන බැණුම් උදෙසා,

09. ඔබවහන්සේගේ ප්‍රතිමා පින්තූර යනාදියට කරන දූෂ්කෘතයන් උදෙසා,

10. ඔබවහන්සේගේ දේවස්ථාන තුළ කරන දේව දූෂණ ක්‍රියාවල් උදෙසා,

11. ඔබවහන්සේට කැපවූවන් පවා ඔබවහන්සේට පෙන්වන නොසැළකිලිකම් උදෙසා,

12. ප්‍රසිද්ධියෙන් හා අප්‍රසිද්ධියෙන් ඔබ වහන්සේට කරන සෑම අපහාසයන් උදෙසා,

13. ඔබවහන්සේගේ අති ශෝක භරිත කඳුළු උදෙසා,

14. ඔබවහන්සේගේ කධුරතර වික්ෂෝපයන් උදෙසා,

15. කඩු පහරින් සිදුරුවූ ඔබවහන්සේගේ අති නිර්මල හෘදය උදෙසා,

## යාච්ඤා කරම්හ

කටුවලින් සිදුරු වූ ඔබගේ නිර්මල හෘදය කුඩා දරුවන්ට පෙන්වා සැනසීම ඉල්ලා සිටි අප අති පෙම්බර මාතාවෙනී, අප ඔබට ඔප්පු කරන මේ සුළු සැනසීම දයාවෙන් පිළිගත මැනව. මින් මත්තට අප මුළු ජීවිතය ඔබට ප්‍රතිකාර කිරීමේ ක්‍රියාවකට හරවාගෙන, ඔබ නිසා පමණක් ජීවත් වීමට අපට සැලැස්සුව මැනව. 'අපගේ ජීවිතය' වන මධුරතර මාතාවෙනී, පණටත් වඩා ඔබට ප්‍රේම කරමින් ඔබ නිසාම ජීවත්වී, ඔබ නිසාම අප ප්‍රාණය පූජා කිරීම දේව කැමැත්ත වේනම් ඊට අප සූදානම් කළ මැනව. නොඑසේ නම් පෙම්බර මාතාවෙනී, එක එක මොහොතක් පාසා ඔබ නිසාම ජීවත්වී,

ඔබ කෙරෙහි ප්‍රේමයෙන්, නැසී ගොස්, ඔබ තුරුල්ලෙහි සදාකාල දේව ගී ගයන්නට අප කැඳවා ගත මැනව. ආමෙන්.

## මාගේ ගෘහය මම කැප කරමි

දුකින් හරිත වූද, නිර්මල වූද හෘදයක් ඇති අති භාග්‍යවන්ත කන්‍යාවෙනි, මේ ගෘහයේ ස්වාමිදුව හා රැජින වශයෙන් අපි ඔබව හඳුනා ගනිමු. ගින්නෙන්, ජලයෙන්, ගිගුරුම්, කුණාටු, භූමිකම්පා, සොරුන්, අධර්මිෂ්ඨයන්, විප්ලවයන්, යුද්ධ, ගුවන් පහර, පීඩන, බදු බර යනාදියෙන් හා ඔබ දන්නා වෙනත් සෑම උවදුරු වලින් අපව රැක ගැනීමට කරුණා කළ මැනව.

මෙහි සිටින්නවුන් හා සිටින්නට යන අයද ඔබගේ පෞද්ගලික වස්තුවක් මෙන් ආශිර්වාද කර, ආරක්ෂා කර, රැකවල් කර, ප්‍රවේශම් කළ මැනව. විපත්වලින් හා අවාසනාවන්ත කමින් ඔවුන් වැළැක්වුව මැනව. මේ සියල්ලට වඩා දෙවිතුමන්ට ඔවුන්ගෙන් වරදක් නොවන පිණිස ප්‍රවේශම් කළ මැනව. කිසි කලෙක මේ ගෘහය තුළ කිසිම මාරක පාපයක් සිදු නොවේවා! තවද මෙහි ප්‍රවේශ වන සියල්ලෝ දෙවියන්ගේ මහිමය සඳහාද ජේසු තුමන්ගේ හා මරිය වහන්සේගේ රජකම සඳහාද, ක්‍රියා කරත්වා,

අහෝ ජේසුනී, මරියනි! ඔබ වහන්සේලාට සදහටම මෙම ගෘහය කැපවේවා. එහි වෙසෙන සියල්ලන් සමග එයට ආශිර්වාද ලැබේවා! ආමෙන්.

## ජුසේ වාස් පියතුමන් වෙනුවෙන් යාච්ඤාව

පෙම්බර මෑණියනි, ඔබවහන්සේ වෙත මහත් භක්තියක් දයාවක් දැක්වූ නිතරම ජපමාලය අත දරමින් අප රට තුළ ඔබ පුතණුවන් වෙනුවෙන් මහත් සේවාවක් කළ භාග්‍යවත් ජුසේ වාස් පියතුමාගේ අමරණීය සේවාව සිහිකළ මැනව. එතුමාගේ නොනිමි උද්යෝගය හා කැපවූ සේවාව නිසා අප රට තුළ මහත් ප්‍රාතිහාර්ය කිරීමට උන්වහන්සේට දෙවිපියාණන් දානය කරන ලද මහඟු වරම් උදෙසා අපි දෙවිපියාණන්ට තුති පුදමු. ප්‍රශංසා කරමු. භාග්‍යවත් ජුසේ වාස් පියතුමා අප රට තුළ නිවී ගිය දහම් සිළුව යළි දල්වා මේ වනතුරු නොනිවී තබන්නට සැලැස්වීම අපි කෘතගුණයෙන් යුක්තව සිහිපත් කරමු.

පෙම්බර මරිය මාතාවෙනි, ක්‍රිස්තු වර්ෂ 1677 අගෝස්තු මස 05 වන දින ගෝව පුර සෙංකෝලේ ග්‍රාමයේ ඔබවහන්සේට කැප කළ දේවස්ථානයකදී ඔබවහන්සේ වෙනුවෙන්

තම ජීවිතය කැප කළ භාග්‍යවත් ජුසේ වාස් පියතුමන්ගේ එම කැපවීම සිහිකොට අපට ද ඔබවහන්සේ වෙනුවෙන් කැපවූ ජීවිතයක් ගත කිරීමට පිහිට ඉල්ලා යාච්ඤා කරමු. තම ජීවිතය තුළ ඉතා කුඩා කෙනෙකුට පවා කීකරුකම පෙන්වා ක්‍රියාවෙන් එය ඔප්පු කළා වූ එතුමන්ගේ එම බැහැපත් කම කරණ කොට ගෙන අපට ද බැහැපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වරම් දානය කළ මැනව. පූජකවරයේ දී තම විශේෂ පොරොන්දුව වශයෙන් හිස් පතුලෙන් ගමන් කිරීමට තීරණය කොට එලෙස ජීවත් වීම කරණ කොට ගෙන උන්වහන්සේ වින්දා වූ මහත් පීඩාව උදෙසා අපට අනුකම්පා කර අපගේ මේ ඉල්ලීම (එනම් ................................) භාග්‍යවත් ජුසේ වාස් පියතුමන්ගේ මධ්‍යස්ථකම කරණ කොට ගෙන උන්වහන්සේගේ නිර්මල ජීවිතය හේතුවෙන් අපට දානය කරන මෙන් දයාවෙන් අයැද සිටිමු. භාග්‍යවත් ජුසේ වාස් පියතුමාණන් අප රටේ ශුද්ධවන්තයාණන් බවට පත්කිරීම සඳහා දෙවිඳුන් ඉදිරියේ මධ්‍යස්ථ වන මෙන් අපි ඔබවහන්සේට යාච්ඤා කරමු.

මෙකීදේ ඔබවහන්සේගේ පුත්‍රයාණන් හා අපගේ ස්වාමීන් වූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ මඟින් අපට ලැබේවා - ආමෙන් ජේසු.






# දේව දයාවේ හෝරාව





ජේසුනි මම ඔබවහන්සේ කෙරෙහි විශ්වාස කරමි










## දයාවේ හෝරාව

ශුද්ධවු පවුස්තිනා තුමියට කළ හෙළිදරව්ව අනුව, ජේසුස් වහන්සේ මෙසේ වදාළ සේක. "ඔරලෝසු පැයෙන් 3.00 ට (පස්වරු 3 ට) විශේෂයෙන් පව්කාරයන් වෙනුවෙන් මාගේ කරුණාව අයදින්න. ස්වල්ප මොහොතක් පමණක්, මා මරණ වේදනාවට පත්ව, තනිවූ මොහොතේ මට ඇති වූ දුක වේදනාව තුළ ඔබ ද ගිලෙන්න. මේ සමස්ත ලෝකයාම සඳහා මහඟු කරුණාව පිළිබිඹු කරන විශිෂ්ඨ හෝරාවයි. මේ හෝරාවේ දී මගේ දුක් ප්‍රාප්තිය නිසාම, යම් ආත්මයක් (කෙනෙක්) මාගෙ න් අයදින ඕනෑම දෙයක් මා ප්‍රතික්ෂේප නොකරමි. (දින පොත iv 1320)

එබැවින් යාච්ඤාවෙන් ඵල ලැබීමට, ජේසු ස්වාමීන් වහන්සේ පොරොන්දු වූ පරිදි අවශ්‍ය කොන්දේසි තුනක් තිබේ.

- එය දෙවියන් වහන්සේගේ කැමැත්ත මත ජේසු සමිඳුන් වෙත යොමු විය යුතුයි.
- එය පස්වරු තුනට සිදු කළ යුතුයි.
- එය ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය මත පදනම් විය යුතුයි.

## සවස 3.00 ට කරන යැදුම

ජේසු සමිදාණෙනි, ඔබ වහන්සේ උකුත් වූ සේක. එනමුදු ජීවනයේ උල්පත ආත්මයන් වෙත ගලා යමින් ඔබ වහන්සේගේ කරුණා සාගරය මුළු ලෝකයටම විවෘත කළ සේක. ජීවනයේ උල්පතෙනී, ඔබ වහන්සේගේ අපරිමිත කරුණාවෙන් මුළු ලෝකය වැළඳගෙන ඔබව අප වෙත හිස් කළ මැනව.


කරුණාවේ උල්පත වන ක්‍රිස්තුන් වහන්සේගේ දිව්‍ය හෘදය තුළින් අප උදෙසා වැහුණු රුධිරය සහ ජලයෙනී, මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාසය තබමි. (3 වරක්)

## අවසන් යැදුම

සදාතන දෙවිඳුනී, කිසිදින නොසිඳෙන දයානුකම්පාවේ නිධානය වන අනන්ත කරුණාබර ස්වාමිනී, අප දෙස දයාවෙන් බලා ඔබවහන්සේගේ කරුණාව අප තුළ වැඩි වර්ධනය කළ මැනව. අපගේ කරදර හා කම්කටොළුවලදී කලකිරීමට සහ අධෛර්යය වීමට ඉඩ නුදුන මැනව. මහත් බලාපොරොත්තුව කින් යුතුව ආදරය හා කරුණාව වන ඔබවහන්සේගේ ශුද්ධවූ කැමැත්තට අපි භාර වෙමු. ආමෙන්.

## දයාවේ මල්දම (දිනපොත 476)

(ජපමාලයක් ආධාරයෙන් උච්චාරණය කරන්න)




**ලොකු ඇට සඳහා**

සදාකාලික පියාණනී ඔබ වහන්සේගේ අති ප්‍රේමණීය පුත්‍රයාණන්ද, අපගේ ස්වාමීන්ද ගැළවුම්කාරයාණන් ද වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රී ශරීරය හා රුධිරයෙන්, ආත්මය හා දේවීකයද අපගේ හා මුළු ලෝකයාගේ පාපවලට වන්දි වශයෙන් ඔබ වහන්සේට මම ඔප්පු කරමි.

**කුඩා ඇට 50 සඳහා**

ජේසු තුමන්ගේ අති කඨෝර වූ දුඛඃ ප්‍රාප්තිය මගින් අපටත් මුළු ලෝකයාටත් දයා වුව මැනව.

**අවසන් කිරීමට තුන්වරක් කියන්න.**

ශුද්ධවූ දෙවියන් වහන්ස,
ශුද්ධවූ සර්වබලධාරීන් වහන්ස,
ශුද්ධවූ අමරණීයයාණන් වහන්ස,
අපටත් මුළු ලෝකයාටත් දයා වුව මැනව.

## ඔලීව උයනේ කටුක වේදනාව

(දින පොත ii 646) ඔලිව් උයනේ දී ජේසුස් ස්වාමින් වහන්සේට විඳීමට සිදු වූ දුක් වේදනා මම අත් දුටුවෙමි. (දින පොත iii 1054) මුළු කාලය තුළම මා සිටියේ මරණ වේදනාව වැනි මූර්ජා (සිහිසුන්) තත්ත්වයක ය. ජේසුස් ස්වාමින් වහන්සේගේ හද ගැස්ම මා තුළ ද ජනිත කරවමින් මාගේ ආත්මය පසාරු කරමින් ද ගමන් කළේය. ගෙත්සෙමෙනියේ බිම් ගෙය තුළ පිහිටි අධිකරණයේ ප්‍රශ්ණ විචාරණ ස්ථානයට ඔවුන් වහන්සේ සමග මම ද ගියෙමි. ඔවුන් වහන්සේට විඳීමට සිදු වූ සෑම වේදනාවක් සමඟ මම ද ඔවුන් වහන්සේ සමඟ සිටියෙමි. මාගේ නෙතට යොමු නොවුනු එක් මොහොතක් හෝ එක බැල්මක් හෝ නොවීය. සෑම ආත්මයක් කෙරෙහි ඔවුන් වහන්සේගේ ප්‍රේමයේ හා දයාවේ සර්වබලධාරීත්වය මම දැනගතිමි. මමද ඔවුන් වහන්සේ සමඟ දුක් වින්දෙමි. එහෙත් මට මිය යාමට නුපුළුවන් විය. ජේසුස් ස්වාමින් වහන්සේ විඳින ලද වේදනා තවමත් ලෝකයා නොදනී.

## කස පහර දීම

(දින පොත i 445) ජේසුස් ස්වාමින් වහන්සේ කණුවක බැඳ නිර්වස්ත්‍ර කරනු මම දුටුවෙමි.

ඒ සමගම කස පහර දීම ද ඇරඹිණ. මිනිසුන් (වධකයෝ) සිව් දෙනෙක් මාරුවෙන් මාරුවට කස පහරින් ඔවුන් වහන්සේට තැලූහ. (දින පොත i 188)

ඔවුන් වහන්සේගේ රුධිරය පොළොවේ ගලන්නට විය. ඇතැම් තැන්වල මස් පවා ගිලිහී ගොස් තිබිණි. සිරුර පිටුපස මස් ගැළවී ඇට කටු දිස් විය. ජේසුස් ස්වාමින් වහන්සේ වැළපෙමින් සුසුමක් හෙළූ සේක. (දින පොත i 445) කුමන පාපයක් හේතු කොට තමන්ට කස පහර දුන්නේ දැයි ඔවුන් වහන්සේ මට දැනගැනීමට සැළසූ සේක. ඒවා අපිරිසිදු කමේ පාපයන් ය. අහෝ ! කස පහර ලබත්දී කොතරම් දරුණු වේදනා ඔවුන් වහන්සේට විඳින්නට සිදු වීද?

## කටු ඔටුන්න පැළඳවීම

(දින පොත i 408) කස පහර දුන් වධකයෝ ස්වාමින් වහන්සේ රැගෙන ගොස්, තුවාල වලට ඇලවී තිබුණු වස්ත්‍රය ඉවත් කළහ. ඒ අවස්ථාවේ දී තුවාල විවෘත විය. වධකයෝ ඉරී ගිය අපිරිසිදු රත් පැහැති සළුවක් විවෘත වූ තුවාල මතට වීසි කොට, ලෑලි කැබැල්ලක් මත

වාඩි වන්නට අණ කළහ. කටු වලින් ඔටුන්නක් ගොතා උන්වහන්සේගේ ශ්‍රී සිරස මත පළඳවා, බට දණ්ඩක් අතෙහි තැබුවෝය.

රජ කෙනෙකුට දක්වන ආචාර සමාචාර පවත්වමින් ඔවුන් වහන්සේට උසුළු විසුළු කළහ. මුහුණට කෙළ ගැසූහ. ඇතැම් අය බට දණ්ඩෙන් හිසට පහර දෙමින් හිංසා පීඩා කළහ. තවත් සමහරු ඔවුන් වහන්සේගේ මුහුණ රෙදි කඩකින් වසා කම්මුලට පහර දුන්හ. ජේසුස් ස්වාමින් වහන්සේ මේ සියල්ල නිහඬව ඉවසා දරා ගත් සේක.

## කුරුසිය දරාගැනීම

(දින පොත i 446) ජේසුස් ස්වාමින් වහන්සේ, කුරුසිය මත ඇණ ගැසුවාක් මෙන් ම, ඇණ ගැසූ ආත්ම පිරිසත් මම දුටිමි. දෙවන තුන්වන ආත්මයන් කණ්ඩායම් ද මම දුටිමි. දෙවැනි ආත්ම කණ්ඩායම කුරුසියට ඇණ ගසා නොතිබිණි. එහෙත් ඔවුන්ගේ අත්වලින් කුරුසිය තදින් ග්‍රහණය කරගෙන සිටියහ. තෙවැනි කණ්ඩායම කුරුසිය මත ඇණ ගැසීමෙන් හෝ කුරුසියකට අත තබා ගැනීමෙන් තොරව සිටියත්, කුරුසියක් ඇදගෙන යාමට සිදුවීම ගැන අකමැත්තට පත්ව සිටියහ. ජේසුස් ස්වාමින් වහන්සේ, මට

මෙසේ පැවසූ සේක. මාගේ වේදනාවලදී ද, මා ප්‍රතික්ෂේප කරන විටදී ද, මා හා සමාන වෙන ආත්මයන් (අය) ඔබ දුටුවෙහි ය. මාගේ මහිමතාවයේදී ද ඔවුහු මට සමාන වෙති. මාගේ වේදනාවන් හා ප්‍රතික්ෂේප කිරීම් වලදී මා හා සුළු වශයෙන් හවුල් වන අයට මාගේ මහිමයේ දී සමාන වීම ද අල්ප වනු ඇත.

## කුරුසිය මත මරණය

(දින පොත ii 648) පස්වරු 3.00 ට ජේසුස් ස්වාමින් වහන්සේ කුරුසිය මත ඇණ ගසා සිටිනු මම දුටිමි. උන්වහන්සේ, මා දෙස බලා මා අමතා මෙසේ පැවසූහ. "මට පිපාසයි."

(දින පොත iii 1032) "මට පිපාසයි, ආත්මයන් ගළවා ගැනීමට මම පිපාසයෙන් පෙළෙමි. ආත්මයන් ගළවා ගැනීමට මට සහය වන්න. මොවුන් ගළවා ගැනීම සඳහා ඔබගේ සියලුම වේදනා මාගේ කධූර වේදනාවන්ට සම්බන්ද කර ඒවා පව්කාරයන් වෙනුවෙන් ස්වර්ගීක පියාණන් වෙත පුදන්න."

(දින පොත ii 648) පිළිරුව දෙපස දිස්වන රැස් දහර යුග්මය ඔවුන් වහන්සේගේ සිරුර

දෙපසින් නිකුත් වන අන්දම ද මම දුටිමි. අනිකුත් ආත්ම මුදවා ගැනීම සහ පච්කාරයන් වෙනුවෙන් මා දිවිය කැප කිරීමේ ආශාවක් මා තුළ ජනිත විය.

(දින පොත ii 813) අහෝ! කුරුසියේ ඇණ ගැසී සිටින දයාවේ ජේසුස් වහන්ස! අපගේ මරණ මොහොතේදී අප සිහි කළ මැනව.

## ශු. මිඛායෙල් අග්‍රදූතයන්ට යාච්ඤාව

අග්‍රදූත ශුද්ධවූ මිඛායෙල් තුමෙනි සටනේදී අප ආරක්ෂා කළ මැනව. යක්ෂයාගේ දුෂ්ඨකම් වලටත් සදිකම් වලටත් විරුද්ධව අපට ආධාරව සිටිය මැනව.

උංට දෙවි මහෝත්තමයාණන් වහන්සේ තරවටු කරන ලෙස අපි බැහැපත්කමින් කන්නලව් කියමු. මෝක්ෂ සේනාධිපති වූ ඔබ වහන්ස, ආත්මයන් විනාශ කරන පිණිස ලෝකයෙහි දුව පැන ඇවිදින, සාතන් සහ අනෙකුත් දුෂ්ඨාත්මයන් ද දේවාත්මානුභාවයෙන් නිරයට හෙලා දමනවා සොඳේ - ආමෙන් ජේසු.

## ශ්‍රී ගල්ලෙනේ යාච්ඤාව


අහෝ! වන්දනීය වූ දේව ගැළවුම් කාරයාණන් වන ජේසු ක්‍රිස්තුනී, සත්තකින්ම අපේ මහා පව් නිසා ඔබ වහන්සේ එදා කල්වාරියේ කුරුස ගසෙහි දිවි පිදූ සේක. අහෝ ක්‍රිස්තුස් ගැළවුම්කාරයාණන්ගේ වන්දනීය වූ කුරුසියෙනි, ජේසු තුමන්ගේ ශ්‍රී කුරුසියෙනි, ශුද්ධවූ කුරුසියෙනි, අපගේ සිතුවිලි සිහිපත් කළ මැනව. ආ! ස්වාමින් වහන්සේගේ ශුද්ධවූ කුරුසියෙනි, සකල විද අන්තරාවලින් ද දුක් කරදර වලින් ද, අප මුදා ගත මැනව.

ආ! ජේසු ගැළවුම් කාරයාණන්ගේ ශුද්ධවූ කුරුසියෙනි, සතුරාගෙන් අප ආරක්ෂා කළ මැනව. ආ! අපගේ ස්වාමින් වහන්සේගේ ශ්‍රී කුරුසියෙනි, අකල් මරණයෙන් අප ගළවා සදා ජීවනය අපට දානය කළ මැනව. ආ! කුරුසියෙහි, ඇණ ගසනු ලැබුවා වූ නාසරෙත්හි ජේසු තුමෙනි, සදාකල් අපට අනුකම්පා කළ මැනව. ජේසුස් ක්‍රිස්තුස් තුමෙනි ඔබ වහන්සේගේ මහිමයෙන් ද දුක් ප්‍රාප්තියෙන්ද උත්ථානයෙන්ද දෙවි කෙනෙකුටම හිමි වූ අහස් නැගීමෙන් ද අපව ස්වර්ගයට පමුණුවනු පිණිස සත්තකින්ම එදා ගවලෙනෙහි, ඉපදී මහ

සිකුරාදා දින කල්වාරි කඳු මුදුනෙහි කුරුසියේ ඇණ ගැසීමෙන් පසු උකුත් වී නිකදේමුස් සහ ජෝශප් යන භක්තිකයන් විසින් කුරුසියෙන් බාන ලදුව තැන්පත් කරනු ලැබූ සේක.

සත්තකින්ම ඔබවහන්සේ ඉපදී 13 වන දින දී රජතුන් කට්ටුව විසින් රත්තරං, තුවරලා සහ සුවඳ ලාටු යන පඬුරු පුදන ලදි. සත්තකින්ම ඔබ වහන්සේ ස්වර්ගාරෝහණය වූ සේක. ජේසු තුමන්ගේ මහිමයෙන් අප සතුරන්ගේ හිරිහැර කරදර හා වංචා වලින් දනුත් සදාකල්හිත් අප ආරක්ෂා කළ මැනව. ආ! ජේසු ක්‍රිස්තුනී අපට කරුණා කළ මැනව. ශුද්ධවූ මරියනී, ශුද්ධවූ ජුසේ තුමෙනි, අප නිසා යාච්ඤා කළ මැනව. (මෙහි අපට අවශ්‍ය දේ සිහිපත් කරන්න) අහෝ ජේසු ක්‍රිස්තුනී සත්තකින්ම ඔබ වහන්සේගේ දුක් ගාවිනා මගින් මේ පාපිෂ්ඨ ලෝකයෙන් ඔබවහන්සේගේ ආත්මය වෙන් වූ සේක. එසේම මරණ වේදනාව කිසිදු පැකිලීමක් නැතිව ඉවසීමෙන් විඳ දරා ගැනීමට අපට ශක්තිය දුන මැනව. ඔබ වහන්සේගේ ශුද්ධවූ දුක් ප්‍රාප්තිය මඟින් දනුත් නිති පතාත් සියලු අන්තරා වලින් අපව ද මුදාලුව මැනව - ආමෙන්.

# ජපමාලයේ උච්චාරණය



දිනපතා ශු. දිව්‍ය පූජා යාගයට
සහභාගි වන්න.

දිනපතා ශු. ජපමාලය
උච්චාරණය කරන්න.

මසකට වරක්වත්
පාපොච්චාරණය කරන්න.

තමන් සතු, හැකි හැම දේ
අන් අය සමඟ බෙදා ගන්න.

සැකසුම
ගරු ගියෝම් නෝනිස් පියතුමා

Wijaya Print Negombo 077 114 114 1